# 5 ශ්‍රේණිය ගණිතය

# පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු


# 13,14 ඒකක



2021.02.21 online පංතියේ ලබා දුන් නිබන්ධනය
for details WhatsApp 071-9020298

සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

# 13 පරිමාව හා ධාරිතාව - 1




1 ඔබගේ පන්ති කාමරයෙන් සොයා ගත හැකි විවිධ භාජනවලට අල්ලන ද්‍රව ප්‍රමාණ ලීටර සහ මිලිලීටර ඇසුරින් නිමානය කරන්න. මිනුම් සරාවක් භාවිත කර එම නිමාන නිවැරදි දැයි බලන්න. ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| තෝරා ගත් භාජනය | සිතූ ද්‍රව ප්‍රමාණය (නිමානය කළ ද්‍රව ප්‍රමාණය) | සැබෑ ද්‍රව ප්‍රමාණය |
|---|---|---|
| වතුර බෝතලය | 1 *l* 500 ml | 1 *l* 400 ml |
| ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ |
| ............................ | ............................ | ............................ |

**2** එකතු කරන්න.

(1)

| | $l$ | ml |
|---|---|---|
| | 4 | 850 |
| + | 2 | 740 |
| | | |

(2)

| | $l$ | ml |
|---|---|---|
| | 6 | 550 |
| + | 7 | 910 |
| | | |

(3)

| | $l$ | ml |
|---|---|---|
| | 12 | 200 |
| + | 11 | 810 |
| | | |

(4)

| | $l$ | ml |
|---|---|---|
| | 6 | 75 |
| + | 2 | 325 |
| | | |

**3** වගන්ති ලියා ගැටලු විසඳන්න.

**උදාහරණය**

භාජනයක තිබූ ජල ප්‍රමාණය 8 $l$ 825 mlකි. එයට තවත් 7 $l$ 270 mlක ජල ප්‍රමාණයක් එකතු කරන ලදි. දැන් භාජනයේ තිබෙන මුළු ජල ප්‍රමාණය කොපමණ ද?

| | | $l$ | ml |
|---|---|---|---|
| තිබූ ජල ප්‍රමාණය | = | 8 | 825 |
| එකතු කළ ජල ප්‍රමාණය | = | 7 | 270 |
| මුළු ජල ප්‍රමාණය | = | 16 | 095 |

භාජනයේ තිබෙන මුළු ජල ප්‍රමාණය 16 $l$ 95 ml වේ.

(1) කමල් රතු පාට තීන්ත 4 $l$ 400 mlක් ඇති භාජනයකට සුදු පාට තීන්ත 2 $l$ 200 mlක් ද එකතු කළේ ය. දැන් භාජනයේ ඇති මුළු තීන්ත ප්‍රමාණය කොපමණ ද?

(2) ඉන්ධන පිරවුම්හලකින් පළමු දිනයේ දී රථයකට ඉන්ධන 4 $l$ 500 mlක් ද දෙවන දිනයේ දී 5 $l$ 750 mlක් ද පුරවන ලදි. දින දෙක තුළ දී රථයට පුරවන ලද මුළු ඉන්ධන ප්‍රමාණය කොපමණ ද?

(3) එක් භාජනයක කිරි 6 $l$ 250 mlක් ද තවත් භාජනයක කිරි 4 $l$ 900 mlක් ද ඇත. භාජන දෙකෙහි ඇති මුළු කිරි ප්‍රමාණය කොපමණ ද?

(4) වෙළෙන්දෙක් පළමු දිනයේ දී පොල් තෙල් 10 $l$ 600 mlක් ද දෙවන දිනයේ දී පොල් තෙල් 11 $l$ 750 mlක් ද විකුණුවේ ය. දින දෙකේ දී ම විකුණන ලද මුළු පොල් තෙල් ප්‍රමාණය කොපමණ ද?

**4** අඩු කරන්න.

| | (1) | | (2) | | (3) | | (4) | |
|---|---|---|---|---|---|---|---|---|
| | $l$ | ml | $l$ | ml | $l$ | ml | $l$ | ml |
| | 7 | 450 | 6 | 410 | 16 | 125 | 14 | 50 |
| − | 5 | 325 | 3 | 700 | 13 | 200 | 11 | 850 |
| | | | | | | | | |

**5** වගන්ති ලියා විසඳන්න.

**උදාහරණය**

ටැංකියක තිබූ ජලය 15 $l$ 800 mlකින් ජලය 8 $l$ 750 mlක් ඉවත් කරන ලදි. ටැංකියේ ඉතුරු වූ ජල ප්‍රමාණය කොපමණ ද?

| | | $l$ | ml |
|---|---|---|---|
| ටැංකියේ තිබූ ජල ප්‍රමාණය | = | 15 | 800 |
| ඉවත් කළ ජල ප්‍රමාණය | = | 8 | 750 |
| ඉතුරු ජල ප්‍රමාණය | = | 7 | 050 |

ටැංකියේ ඉතුරු වූ ජල ප්‍රමාණය 7 $l$ 50 ml වේ.

(1) භාජනයක කිරි 17 $l$ 650 mlක් තිබුණි. එයින් 12 $l$ 750 mlක් විකිණූ පසු ඉතුරු වන කිරි ප්‍රමාණය කොපමණ ද?

(2) විකිණීම සඳහා ගෙනෙන ලද පොල් තෙල් 7 $l$ 500 mlකින් පොල් තෙල් 1 $l$ 900 mlක් ඉතුරු විය. විකිණී ඇති පොල් තෙල් ප්‍රමාණය කොපමණ ද?

(3) පලතුරු බීම වෙළෙඳසලක දොඩම් බීම 14 $l$ 200 mlක් ද දිවුල් බීම 10 $l$ 150 mlක් ද විකිණී ඇත. දිවුල් බීමවලට වඩා දොඩම් බීම කොපමණ ප්‍රමාණයක් විකිණී ඇති ද?

(4) ජලය 25 $l$ක් දැමිය හැකි බැරලයක තිබෙන ජල ප්‍රමාණය 16 $l$ 500 mlකි. බැරලය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජල ප්‍රමාණයක් දැමිය යුතු ද?

# 14 බර මැනීම - 1

බර මැනීම සඳහා විවිධ තරාදි භාවිත වේ.



තැටි තරාදිය



දුනු තරාදිය



මුළුතැන් ගෙහි
භාවිත වන තරාදිය



ඉලෙක්ට්‍රොනික තරාදිය




බිම් තරාදිය

1 ගුරුතුමා / ගුරුතුමිය විසින් විවිධ ප්‍රමාණයෙන් වැලි පුරවන ලද පාර්සල් 4ක් ඔබට ලබා දෙනු ඇත. එම පාර්සල් A, B, C, D ලෙස ලේබල් කරන්න. එක් එක් පාර්සලයේ බර නිමානය කරන්න. තරාදියක් භාවිත කර එම නිමාන නිවැරදි දැයි බලන්න. ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාර්සලය | සිතූ බර (නිමානය කළ බර) | සැබෑ බර |
|---|---|---|
| A | ............................ | ............................ |
| B | ............................ | ............................ |
| C | ............................ | ............................ |
| D | ............................ | ............................ |

2 එක් එක් තරාදියේ ඇති ද්‍රව්‍යයේ බර ලියන්න.

(1)





අර්තාපල්වල බර = ..................................

(2)




ඇපල් ගෙඩිවල බර = .......................................

(3)




පත්තර මිටියේ බර = .....................................

**3** පිළිතුරු සපයන්න.

**උදාහරණය 1**

| | kg | g |
|---|---|---|
| | 5 | 500 |
| + | 3 | 750 |
| | 9 | 250 |

**උදාහරණය 2**

| | kg | g |
|---|---|---|
| | 8 | 75 |
| + | 2 | 51 |
| | 10 | 126 |

(1)

| | kg | g |
|---|---|---|
| | 3 | 225 |
| + | 1 | 190 |
| | | |

(2)

| | kg | g |
|---|---|---|
| | 25 | 900 |
| + | 45 | 500 |
| | | |

(3)

| | kg | g |
|---|---|---|
| | 52 | 500 |
| + | 33 | 500 |
| | | |

(4)

| | kg | g |
|---|---|---|
| | 4 | 250 |
| + | 5 | 825 |
| | | |

(5)

| | kg | g |
|---|---|---|
| | 11 | 750 |
| + | 13 | 250 |
| | | |

(6)

| | kg | g |
|---|---|---|
| | 5 | 50 |
| + | 3 | 50 |
| | | |

**4** වගන්ති ලියා විසඳන්න.

**උදාහරණය**

සුමුදු මිල දී ගත් කොමඩු ගෙඩියේ බර 1 kg 800 gකි. කමනි මිල දී ගත් කොමඩු ගෙඩියේ බර 1 kg 750 gකි. දෙදෙනා ම මිල දී ගත් කොමඩු ගෙඩිවල මුළු බර කොපමණ ද?

| | | kg | g |
|---|---|---|---|
| සුමුදු මිල දී ගත් කොමඩු ගෙඩියේ බර | = | 1 | 800 |
| කමනි මිල දී ගත් කොමඩු ගෙඩියේ බර | = | 1 | 750 |
| කොමඩු ගෙඩි දෙකේ ම මුළු බර | = | 3 | 550 |

කොමඩු ගෙඩිවල මුළු බර 3 kg 550 gක් වේ.

(1) එක් සහල් මල්ලක බර 5 kg 500 gකි. අනෙක් සහල් මල්ලේ බර 8 kg 750 gකි. සහල් මලු දෙකේ මුළු බර කොපමණ ද?

(2) ගෝනියක තිබූ තේ දළුවල බර 21 kg 250 gකි. එයට තව තේ දළු 17 kg 750 gක් එකතු කරන ලදි. දැන් ගෝනියේ ඇති තේ දළුවල මුළු බර කොපමණ ද?

(3) එක් කෙසෙල් ඇවරියක බර 2 kg 850 gකි. තවත් කෙසෙල් ඇවරියක බර 1 kg 300 gකි. කෙසෙල් ඇවරි දෙකේ මුළු බර කොපමණ ද?

(4) වෙළෙන්දෙක් තමන් මිල දී ගත් ගම්මිරිස් 12 kg 750 gකට ගෙවත්තෙන් ලබා ගත් ගම්මිරිස් 2 kg 500 gක් එකතු කළේ ය. වෙළෙන්දා ළඟ ඇති ගම්මිරිස්වල මුළු බර කොපමණ ද?

**5** විසඳන්න.

**උදාහරණය**

| | kg | g |
|---|---|---|
| | 4 | 350 |
| – | 1 | 750 |
| | 2 | 600 |

(1)

| | kg | g |
|---|---|---|
| | 12 | 840 |
| – | 4 | 510 |

(2)

| | kg | g |
|---|---|---|
| | 6 | 320 |
| – | 2 | 150 |

(3)

| | kg | g |
|---|---|---|
| | 15 | 400 |
| – | 9 | 500 |

(4)

| | kg | g |
|---|---|---|
| | 39 | 670 |
| – | 23 | 765 |

6 වගන්ති ලියා විසඳන්න.

**උදාහරණය**

වට්ටක්කා ගෙඩියක බර 4 kg 200 gකි. ඉන් කොටසක් කපා විකුණූ පසු ඉතුරු කොටසේ බර 2 kg 90 gකි. විකුණූ කොටසේ බර කොපමණ ද?

| | | kg | g |
|---|---|---|---|
| වට්ටක්කා ගෙඩියේ බර | = | 4 | 200 |
| ඉතුරු කොටසේ බර | = | 2 | 090 |
| විකුණූ කොටසේ බර | = | 2 | 110 |

විකුණූ කොටසේ බර 2 kg 110 gක් වේ.


(1) වෙළෙන්දෙක් බතල 65 kg 700 gකින් බතල 31 kg 800 gක් විකුණුවේ ය. ඉතුරු බතල ප්‍රමාණයේ බර කොපමණ ද?

(2) අයියාගේ බර 46 kg 250 gකි. මල්ලීගේ බර 32 kg 500 gකි. අයියා මල්ලීට වඩා කොපමණ බරින් වැඩි ද?

(3) විකිණීම සඳහා 50 kgක් බැගින් පත්තර මිටි බඳිනු ලැබේ. පත්තර ගොඩක බර 42 kg 750 gකි. පත්තර මිටියක් සෑදීම සඳහා තව කොතරම් බර ප්‍රමාණයක පත්තර අවශ්‍ය වේ ද?

(4) වෙළෙන්දෙක් සිරිල්ගෙන් රාබු 20 kg 250 gක් ද, ගුණපාලගෙන් රාබු 15 kg 750 gක් ද මිල දී ගත්තේ ය. ගුණපාලට වඩා සිරිල්ගෙන් මිල දී ගත් රාබුවල බර කොපමණ ද?

# 13 පරිමාව හා ධාරිතාව - 1




1. ඔබගේ පන්ති කාමරයෙන් සොයා ගත හැකි විවිධ භාජනවලට අල්ලන ද්‍රව ප්‍රමාණ ලීටර සහ මිලිලීටර ඇසුරින් නිමානය කරන්න. මිනුම් සරාවක් භාවිත කර එම නිමාන නිවැරදි දැයි බලන්න. ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| තෝරා ගත් භාජනය | සිතූ ද්‍රව ප්‍රමාණය (නිමානය කළ ද්‍රව ප්‍රමාණය) | සැබෑ ද්‍රව ප්‍රමාණය |
|---|---|---|
| වතුර බෝතලය | 1 l 500 ml | 1 l 400 ml |
| කුඩා බීම බෝතලය | 850 ml | 750 ml |
| කිරි ටින් එක | 1 l 500 ml | 1 l 680 ml |
| ගම් බෝතලය | 15 ml | 20 ml |
| ජෑම් බෝතලය | 700 ml | 650 ml |

2 එකතු කරන්න.

| | (1) | | (2) | | (3) | | (4) |
|---|---|---|---|---|---|---|---|
| *l* | ml | *l* | ml | *l* | ml | *l* | ml |
| 4 | 850 | 6 | 550 | 12 | 200 | 6 | 75 |
| + 2 | 740 | + 7 | 910 | + 11 | 810 | + 2 | 325 |
| **7** | **590** | **14** | **460** | **24** | **010** | **8** | **400** |

3 වගන්ති ලියා ගැටලු විසඳන්න.

**උදාහරණය**

භාජනයක තිබූ ජල ප්‍රමාණය 8 *l* 825 mlකි. එයට තවත් 7 *l* 270 mlක ජල ප්‍රමාණයක් එකතු කරන ලදි. දැන් භාජනයේ තිබෙන මුළු ජල ප්‍රමාණය කොපමණ ද?

| | | *l* | ml |
|---|---|---|---|
| තිබූ ජල ප්‍රමාණය | = | 8 | 825 |
| එකතු කළ ජල ප්‍රමාණය | = | 7 | 270 |
| මුළු ජල ප්‍රමාණය | = | 16 | 095 |

භාජනයේ තිබෙන මුළු ජල ප්‍රමාණය 16 *l* 95 ml වේ.

(1) කමල් රතු පාට තීන්ත 4 *l* 400 mlක් ඇති භාජනයකට සුදු පාට තීන්ත 2 *l* 200 mlක් ද එකතු කළේ ය. දැන් භාජනයේ ඇති මුළු තීන්ත ප්‍රමාණය කොපමණ ද? **6 l 600 ml**

(2) ඉන්ධන පිරවුම්හලකින් පළමු දිනයේ දී රථයකට ඉන්ධන 4 *l* 500 mlක් ද දෙවන දිනයේ දී 5 *l* 750 mlක් ද පුරවන ලදි. දින දෙක තුළ දී රථයට පුරවන ලද මුළු ඉන්ධන ප්‍රමාණය කොපමණ ද? **10 l 250 ml**

(3) එක් භාජනයක කිරි 6 *l* 250 mlක් ද තවත් භාජනයක කිරි 4 *l* 900 mlක් ද ඇත. භාජන දෙකෙහි ඇති මුළු කිරි ප්‍රමාණය කොපමණ ද? **11 l 150 ml**

(4) වෙළෙන්දෙක් පළමු දිනයේ දී පොල් තෙල් 10 *l* 600 mlක් ද දෙවන දිනයේ දී පොල් තෙල් 11 *l* 750 mlක් ද විකුණුවේ ය. දින දෙකේ දී ම විකුණන ලද මුළු පොල් තෙල් ප්‍රමාණය කොපමණ ද?

**22 l 350 ml**



4 අඩු කරන්න.

| | (1) | | (2) | | (3) | | (4) |
|---|---|---|---|---|---|---|---|
| $l$ | ml | $l$ | ml | $l$ | ml | $l$ | ml |
| 7 | 450 | 6 | 410 | 16 | 125 | 14 | 50 |
| − 5 | 325 | − 3 | 700 | − 13 | 200 | − 11 | 850 |
| **2** | **025** | **2** | **710** | **2** | **900** | **2** | **200** |

5 වගන්ති ලියා විසඳන්න.

**උදාහරණය**

ටැංකියක තිබූ ජලය 15 $l$ 800 mlකින් ජලය 8 $l$ 750 mlක් ඉවත් කරන ලදි. ටැංකියේ ඉතුරු වූ ජල ප්‍රමාණය කොපමණ ද?

| | | $l$ | ml |
|---|---|---|---|
| ටැංකියේ තිබූ ජල ප්‍රමාණය | = | 15 | 800 |
| ඉවත් කළ ජල ප්‍රමාණය | = | 8 | 750 |
| ඉතුරු ජල ප්‍රමාණය | = | 7 | 050 |

ටැංකියේ ඉතුරු වූ ජල ප්‍රමාණය 7 $l$ 50 ml වේ.

(1) භාජනයක කිරි 17 $l$ 650 mlක් තිබුණි. එයින් 12 $l$ 750 mlක් විකිණූ පසු ඉතුරු වන කිරි ප්‍රමාණය කොපමණ ද? **4 l 900 ml**

(2) විකිණීම සඳහා ගෙනෙන ලද පොල් තෙල් 7 $l$ 500 mlකින් පොල් තෙල් 1 $l$ 900 mlක් ඉතුරු විය. විකිණී ඇති පොල් තෙල් ප්‍රමාණය කොපමණ ද? **5 l 600 ml**

(3) පලතුරු බීම වෙළෙඳසලක දොඩම් බීම 14 $l$ 200 mlක් ද දිවුල් බීම 10 $l$ 150 mlක් ද විකිණී ඇත. දිවුල් බීමවලට වඩා දොඩම් බීම කොපමණ ප්‍රමාණයක් විකිණී ඇති ද? **4 l 050 ml**

(4) ජලය 25 $l$ක් දැමිය හැකි බැරලයක තිබෙන ජල ප්‍රමාණය 16 $l$ 500 mlකි. බැරලය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජල ප්‍රමාණයක් දැමිය යුතු ද?

**8 l 500 ml**

# 14 බර මැනීම - 1

බර මැනීම සඳහා විවිධ තරාදි භාවිත වේ.


තැටි තරාදිය


දුනු තරාදිය


මුළුතැන් ගෙහි භාවිත වන තරාදිය


ඉලෙක්ට්‍රොනික තරාදිය



බිම් තරාදිය

1 ගුරුතුමා / ගුරුතුමිය විසින් විවිධ ප්‍රමාණයෙන් වැලි පුරවන ලද පාර්සල් 4ක් ඔබට ලබා දෙනු ඇත. එම පාර්සල් A, B, C, D ලෙස ලේබල් කරන්න. එක් එක් පාර්සලයේ බර නිමානය කරන්න. තරාදියක් භාවිත කර එම නිමාන නිවැරදි දැයි බලන්න. ඒ අනුව පහත වගුව සම්පූර්ණ කරන්න.

| පාර්සලය | සිතූ බර (නිමානය කළ බර) | සැබෑ බර |
|---|---|---|
| A | 300 g | 350 g |
| B | 500 g | 475 g |
| C | 1 kg 250 g | 1 kg 375 g |
| D | 5 kg | 4 kg 800 g |


2 එක් එක් තරාදියේ ඇති ද්‍රව්‍යයේ බර ලියන්න.

(1)





අර්තාපල්වල බර = 2 kg 500 g

(2)




ඇපල් ගෙඩිවල බර = 1 kg

(3)




පත්තර මිටියේ බර = 4 kg

3 පිළිතුරු සපයන්න.

**උදාහරණය 1**

| kg | g |
|---|---|
| 5 | 500 |
| + 3 | 750 |
| 9 | 250 |

**උදාහරණය 2**

| kg | g |
|---|---|
| 8 | 75 |
| + 2 | 51 |
| 10 | 126 |

(1)

| kg | g |
|---|---|
| 3 | 225 |
| + 1 | 190 |
| **4** | **415** |

(2)

| kg | g |
|---|---|
| 25 | 900 |
| + 45 | 500 |
| **71** | **400** |

(3)

| kg | g |
|---|---|
| 52 | 500 |
| + 33 | 500 |
| **86** | **000** |

(4)

| kg | g |
|---|---|
| 4 | 250 |
| + 5 | 825 |
| **10** | **075** |

(5)

| kg | g |
|---|---|
| 11 | 750 |
| + 13 | 250 |
| **25** | **000** |

(6)

| kg | g |
|---|---|
| 5 | 50 |
| + 3 | 50 |
| **8** | **100** |

4 වගන්ති ලියා විසඳන්න.

**උදාහරණය**

සුමුදු මිල දී ගත් කොමඩු ගෙඩියේ බර 1 kg 800 gකි. කමනි මිල දී ගත් කොමඩු ගෙඩියේ බර 1 kg 750 gකි. දෙදෙනා ම මිල දී ගත් කොමඩු ගෙඩිවල මුළු බර කොපමණ ද?

| | | kg | g |
|---|---|---|---|
| සුමුදු මිල දී ගත් කොමඩු ගෙඩියේ බර | = | 1 | 800 |
| කමනි මිල දී ගත් කොමඩු ගෙඩියේ බර | = | 1 | 750 |
| කොමඩු ගෙඩි දෙකේ ම මුළු බර | = | 3 | 550 |

කොමඩු ගෙඩිවල මුළු බර 3 kg 550 gක් වේ.

(1) එක් සහල් මල්ලක බර 5 kg 500 gකි. අනෙක් සහල් මල්ලේ බර 8 kg 750 gකි. සහල් මලු දෙකේ මුළු බර කොපමණ ද?

**14 kg 250 g**

(2) ගෝනියක තිබූ තේ දළුවල බර 21 kg 250 gකි. එයට තව තේ දළු 17 kg 750 gක් එකතු කරන ලදි. දැන් ගෝනියේ ඇති තේ දළුවල මුළු බර කොපමණ ද? **39 kg**

(3) එක් කෙසෙල් ඇවරියක බර 2 kg 850 gකි. තවත් කෙසෙල් ඇවරියක බර 1 kg 300 gකි. කෙසෙල් ඇවරි දෙකේ මුළු බර කොපමණ ද?

**4 kg 150 g**

(4) වෙළෙන්දෙක් තමන් මිල දී ගත් ගම්මිරිස් 12 kg 750 gකට ගෙවත්තෙන් ලබා ගත් ගම්මිරිස් 2 kg 500 gක් එකතු කළේ ය. වෙළෙන්දා ළඟ ඇති ගම්මිරිස්වල මුළු බර කොපමණ ද? **15 kg 250 g**

5 විසඳන්න.

**උදාහරණය**

| | kg | g |
|---|---|---|
| | 4 | 350 |
| – | 1 | 750 |
| | 2 | 600 |

(1)

| | kg | g |
|---|---|---|
| | 12 | 840 |
| – | 4 | 510 |
| | **8** | **330** |

(2)

| | kg | g |
|---|---|---|
| | 6 | 320 |
| – | 2 | 150 |
| | **4** | **170** |

(3)

| | kg | g |
|---|---|---|
| | 15 | 400 |
| – | 9 | 500 |
| | **5** | **900** |

(4)

| | kg | g |
|---|---|---|
| | 39 | 670 |
| – | 23 | 765 |
| | **15** | **905** |

6 වගන්ති ලියා විසඳන්න.

**උදාහරණය**

වට්ටක්කා ගෙඩියක බර 4 kg 200 gකි. ඉන් කොටසක් කපා විකුණූ පසු ඉතුරු කොටසේ බර 2 kg 90 gකි. විකුණූ කොටසේ බර කොපමණ ද?

| | | kg | g |
|---|---|---|---|
| වට්ටක්කා ගෙඩියේ බර | = | 4 | 200 |
| ඉතුරු කොටසේ බර | = | 2 | 090 |
| විකුණූ කොටසේ බර | = | 2 | 110 |

විකුණූ කොටසේ බර 2 kg 110 gක් වේ.

(1) වෙළෙන්දෙක් බතල 65 kg 700 gකින් බතල 31 kg 800 gක් විකුණුවේ ය. ඉතුරු බතල ප්‍රමාණයේ බර කොපමණ ද?
**33 kg 900 g**

(2) අයියාගේ බර 46 kg 250 gකි. මල්ලීගේ බර 32 kg 500 gකි. අයියා මල්ලීට වඩා කොපමණ බරින් වැඩි ද?
**13 kg 750 g**

(3) විකිණීම සඳහා 50 kgක් බැගින් පත්තර මිටි බඳිනු ලැබේ. පත්තර ගොඩක බර 42 kg 750 gකි. පත්තර මිටියක් සෑදීම සඳහා තව කොතරම් බර ප්‍රමාණයක පත්තර අවශ්‍ය වේ ද?
**7 kg 250g**

(4) වෙළෙන්දෙක් සිරිල්ගෙන් රාබු 20 kg 250 gක් ද, ගුණපාලගෙන් රාබු 15 kg 750 gක් ද මිල දී ගත්තේ ය. ගුණපාලට වඩා සිරිල්ගෙන් මිල දී ගත් රාබුවල බර කොපමණ ද?
**4 kg 500 g**